# වික්ටෝරියානු බලශක්ති වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ඇති පාරිභෝගික අයිතීන්



Sinhalese | සිංහල

## බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන වෙත මාරු වී ඔබේ බලශක්ති බිල්පත් ඉතිරි කරගන්න

Victorian Energy Upgrades (VEU) වැඩසටහන මඟින් ඔබට බලශක්ති බිල්පත් ඉතිරි කර ගැනීම සඳහා වට්ටම් සහිත බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන පිරිනමයි.

VEU යනු වික්ටෝරියානු රජයේ මුලපිරීමක් වන අතර, විදුලි බිල කපා හැරීමට සහ එම බලය එලියට විහිදී යාම අඩු කිරීමට නිවාස සහ ව්‍යාපාරවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා දිරිමත් කරයි.

VEU චර්යාධර්ම සංග්‍රහය යටතේ, අලෙවිකරුවන් පාරිභෝගිකයින්ට වැඩසටහන යටතේ ඔවුන්ගේ පාරිභෝගික අයිතිවාසිකම් දක්වා ඇති මෙම කරුණු පත්‍රිකාවේ පිටපතක් ලබා දිය යුතුය. මෙම කරුණු පත්‍රිකාව VEU චර්යාධර්ම සංග්‍රහය යටතේ වික්ටෝරියානු බලශක්ති කාර්යක්ෂමතා ඉලක්කය (VEET) යෝජනා ක්‍රම තොරතුරු පත්‍රිකාව ලෙසද හැඳින්වේ.

### සුදුසුකම්

වික්ටෝරියානු නිවාස සහ ව්‍යාපාරවලට වැඩසටහන හරහා වට්ටම් සහිත බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන සහ සේවාවන් වෙත ප්‍රවේශ විය හැක.

### ඔබේ බලශක්ති බිල්පත් මත ඉතිරි කරන්න

| | නිවැසියෝ | ව්‍යාපාර |
|---|---|---|
| **වසරක් සඳහා වත්මන් ඉතිරි කිරීම්** | සාමාන්‍ය පවුලකට වසරකට $120 සහ $1,100 අතර ඉතිරි කර ගත හැක*. | ව්‍යාපාරවලට වසරකට $500 සහ $74,000 අතර ඉතිරිකරගත හැක*. |

* වැඩිදියුණු කිරීම/ව්‍යාපාර ප්‍රමාණය අනුව රඳා පවතී

### ලබාගත් හැකි නිෂ්පාදිතයක් හෝ පිළිගත් සැපයුම්කරුවෙකු සොයා ගැනීමට

**victorianenergyupgrades.vic.gov.au** වෙත යන්න
(03) 9032 1310 හි VEU උපකාරක සේවාව අමතන්න

බිහිරිබව, ශ්‍රවණ හෝ කථන ආබාධ තිබේද? **133 677** හෝ **relayservice.gov.au හි** ජාතික රිලේ සේවාව අමතන්න

### VEU වැඩසටහන යටතේ ඔබේ අයිතිවාසිකම්

VEU වැඩසටහනේ චර්යාධර්ම සංග්‍රහය පාරිභෝගික ආරක්ෂාව සඳහා අවම ප්‍රමිතීන් සහතික කරයි. එය වැඩිදියුණු කිරීම් බෙදා හැරීමට හෝ අලෙවි කිරීමට සම්බන්ධ සියලු දෙනාටම අදාළ වේ.

### ටෙලි මාර්කටින් සහ දොරට තට්ටු කිරීම තහනම් කිරීම

VEU වැඩසටහන යටතේ, 2024 මැයි 1 සිට අනවශ්‍ය ලෙසට දුරකථනයෙන් කරන අලෙවිකරණය තහනම් කර ඇති අතර, 2024 අගෝස්තු 1 සිට දොරට තට්ටු කිරීම තහනම් වේ.

දුරකථනයෙන් කරන අලෙවිකරණය සහ දොරට තට්ටු කිරීමට අවසර දෙනු ලබන්නේ පූර්ව අනුමැතිය ඇතිව හෝ නිෂ්පාදන නැවත කැඳවීම් හෝ වැඩිදියුණු කිරීම සඳහා හමුවීමක් වෙන්කරවා ගැනීම වැනි විශේෂිත අරමුණු සඳහා පමණි.

තහනම ආරම්භ වූ පසු ඔබට ඇමතුමක් හෝ අවසරයකින් තොරව පැමිණියහොත්, මෙය අත්‍යවශ්‍ය සේවා කොමිෂන් සභාව **(03) 9032 1310** හෝ **veu@esc.vic.gov.au** වෙත වාර්තා කරන්න.

හැකි නම්, කරුණාකර ව්‍යාපාරයේ නම, වේලාව, දිනය සහ අලෙවි කළ දේ ඇතුළත් කරන්න.

## අලෙවිකරණ කටයුතු

VEU වැඩසටහන පිළිබඳව ඔබව සම්බන්ධ කර ගන්නා පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් කළ යුත්තේ:

- අධි පීඩන විකුණුම් හෝ අලෙවිකරණ උපක්‍රම භාවිතා නොකර සිටීමයි
- ඔබ 18 ට වැඩි නම් සහ තොරතුරු තේරුම් ගැනීමට හැකි නම් පමණක් ඔබට වෙළඳපොළ/විකුණුම් වැඩිදියුණු කිරීම් කිරීමයි
- වැඩසටහනට සහභාගී වීම විකල්ප බව පැහැදිලි කිරීමයි
- ඔවුන් වැඩ කරන ව්‍යාපාරයේ නම හෙළි කිරීමයි
- පුද්ගල අලෙවිකරණය සඳහා ඡායාරූපයක්, සම්පූර්ණ නම, සම්බන්ධතා තොරතුරු, ABN සහ ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ විස්තර සහිත හැඳුනුම්පතක් පැලඳීමයි
- යෝග්‍යතාවය ඇතුළුව භාණ්ඩ හෝ සේවා පිළිබඳ නිවැරදි තොරතුරු සැපයීමයි
- කැමැත්ත ලබා ගැනීම සහ දායකත්වයෙන් ඉවත් වීමට පහසු විකල්ප ලබා දීම ඇතුළුව, අලෙවිකරණ ඊමේල් හෝ SMS සඳහා අනවසර තැපැල් සඳහා ඇති නීති පිළිපදින්න
- වික්ටෝරියානු රජය හෝ අත්‍යාවශ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ සම්බන්ධකම් හෝ වික්ටෝරියානු රජය අලෙවිකරණ අරමුණු සඳහා පුද්ගලික සම්බන්ධතා තොරතුරු සපයන බවට අසත්‍ය හෝ රැවටිලිකාර හිමිකම් ඉදිරිපත් නොකර සිටීමයි

## ගිවිසුම්

VEU වැඩසටහන යටතේ ක්‍රියාකාරකමක් සඳහා ඔබට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් කළ යුත්තේ:

- වයස අවුරුදු 18 හෝ ඊට වැඩි අයෙකු සමඟ පමණක් ගිවිසුමකට එළඹීමයි
- වැඩ ආරම්භ කිරීමට පෙර සැලසුම් කළ වැඩ පිළිබඳ පැහැදිලි සන්නිවේදනයක් සහතික කර ගැනීමයි
- නිෂ්පාදන/සේවා විස්තර, මිල ගණන්, ගාස්තු, ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටි සහ සිසිලන කාල සීමාවන් ඇතුළුව VEU වැඩසටහන් හිමිකම්, වැඩිදියුණු කිරීම් සහ ගිවිසුම් පිළිබඳ සවිස්තර තොරතුරු සැපයීමයි
- උපාංග සම්බන්ධ කරන පුද්ගලයා පිළිබඳව විස්තර සහ සම්බන්ධතා තොරතුරු සැපයීමයි

## වැඩ භාර ගැනීම

ඔබේ නිවසේ හෝ ව්‍යාපාරයේ VEU වැඩසටහන යටතේ වැඩිදියුණු කිරීමක් සඳහා වැඩ ආරම්භ කරන පුද්ගලයෙකු හෝ ව්‍යාපාරයක් කළ යුත්තේ:

- ඔබේ කැමැත්ත ඇතිව පමණක් වැඩ ආරම්භ කිරීමයි
- වැඩ ආරම්භ කිරීමට පෙර, වේලාව, දිනය, නිෂ්පාදන/සේවාව, සහ උපාංග සම්බන්ධ කරන පුද්ගලයා පිළිබඳ තොරතුරු ඇතුළුව රැකියා විස්තර ගැන ඔබට දැන්වීමයි
- වයස අවුරුදු 18 හෝ ඊට වැඩි කිසිවෙක් නොමැති නම් පරිශ්‍රයෙන් පිටව යාමයි
- රැකියාව අවසන් වූ පසු සම්බන්ධතා තොරතුරු සැපයීමයි
- ආරවුල් විසඳීම සහ වගකීම් පිළිබඳ තොරතුරු සැපයීමයි

## VEU වැඩසටහන ගැන අප සමඟ කතා කිරීමට අවශ්‍යද?

- ඔබට පැමිණිල්ලක් ඇත්නම් හෝ ඉහත දක්වා ඇති පරිදි ඔබේ අයිතිවාසිකම්වලට අනුකූල නොවන ක්‍රියාවන් පිළිබඳව වාර්තා කිරීමට, **(03) 9032 1310** හෝ **veu@esc.vic.gov.au** හරහා අත්‍යවශ්‍ය සේවා කොමිෂන් සභාව අමතන්න.
- සාමාන්‍ය VEU ආශ්‍රිත ප්‍රශ්න සඳහා, **energy.upgrades@deeca.vic.gov.au** හි බලශක්ති, පරිසර සහ දේශගුණික ක්‍රියා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගන්න
- පාරිභෝගිකයෙකු ලෙස ඔබේ අයිතිවාසිකම් සඳහා උදව් ලබා ගැනීමට ඔබ යා යුත්තේ කොතැනකට ද? කරුණාකර **පාරිභෝගික කටයුතු වික්ටෝරියා** අමතන්න. **consumer.vic.gov.au/contact-us** හෝ **131 450.** වෙත පිවිසෙන්න

**ඔබට මෙම කරුණු පත්‍රිකාවේ පරිවර්තිත පිටපතක් අවශ්‍ය නම්, කරුණාකර energy.vic.gov.au/translation වෙත පිවිසෙන්න**

2024 අප්‍රේල් © වික්ටෝරියා ප්‍රාන්තයේ බලශක්ති, පරිසරය සහ දේශගුණික ක්‍රියාමාර්ගය

**නිර්මාණකරුවන්ගේ ක්‍රියාවන් ජනතාව අතරට ගෙනයාමට නොමිලේ බලපත්‍ර සපයන ලාභ නොබලා කටයුතු කරන ජාත්‍යන්තර සංවිධානය**

මෙම කාර්යය Creative Commons Attribution 4.0 ජාත්‍යන්තර බලපත්‍රයක් යටතේ බලපත්‍ර ලබා ඇත, Creative Commons ( වෙබ් අඩවියට පිවිසෙන්න (http://creativecommons.org/licenses/by/4.0/).

**ISBN** 978-1-76136-716-8 **(Print)**
**ISBN** 978-1-76136-717-5 **(pdf/online/MS word)**

**ප්‍රතික්ෂේප කිරීම:** මෙම ප්‍රකාශනය ඔබට උපකාරී විය හැකි වුවත්, වික්ටෝරියානු ප්‍රාන්තය හෝ එහි සේවානියුක්තිකයන් මෙම ප්‍රකාශනය කිසිසේත් ම දෝෂ රහිත බවට හා ඔබේ අරමුණට සම්පූර්ණයෙන් ම උචිත බවට වග නොකියන හෙයින් මෙම ප්‍රකාශයේ ඇති තොරතුරු විශ්වාස කිරීමෙන් ඇති විය හැකි වැරදි, පාඩු හෝ වෙනත් ප්‍රතිඵල සම්බන්ධයෙන් වගවීමක් දරනු නොලැබේ.

**ප්‍රවේශ්‍යතාව:** මෙම ලේඛනය විකල්ප ආකෘතියකින් ලබා ගැනීමට, 136 186 අංකයෙන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට අමතන්න, customer.service@delwp.vic.gov.au විද්‍යුත් තැපෑලෙන් කරන්න, නැතහොත් 133 677 ඔස්සේ ජාතික රිලේ සේවාව අමතන්න. DEECA වෙබ් අඩවියේ (www.deeca.vic.gov.au) ඇත.